FACULTY OF GRADUATE STUDIES
RECEIVED
17 OCT 2013
UNIV... ANIYA

# වීදි දරුවන් සහ ඔවුන්ගේ පුනරුත්ථාපනය කෙරෙහි බලපාන ගැටළු පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයකි.

දුලානි ප්‍රියංගිකා මල්වැව

විභාග අංකය -FGS/S/MSSC/2007/10

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ
සමාජවිද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී. - 2007

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 847 |
| වර්ග අංකය: | |

## නිබන්ධ සාරාංශය


කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා සකස් කළ යුතු පර්යේෂණ නිබන්ධය වෙනුවෙන් **"වීදිදරුවන් සහ ඔවුන්ගේ පුනරුත්ථාපනය කෙරෙහි බලපාන ගැටළු පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්** යන මාතෘකාව යටතේ තොරතුරු රැස් කළෙමි.

කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ල නාගරික ප්‍රදේශය සීඝ්‍ර සමාජ ආර්ථික දේශපාලනික වෙනස්කම්වලට ලක්වෙමින් දැඩි නාගරීකරණයකට ලක්වී ඇති බැවින් තොරතුරු රැස් කිරීම සඳහා මෙම ප්‍රදේශය යොදා ගතිමි. වීදි දරුවන් ඔවුන්ගේ භාරකරුවන් ඥාතීන් හා පුනරුත්ථාපන ආයතනය මගින් ද සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලිය හා නිරීක්ෂණය තුළින් කරුණු එක්රැස් කළෙමි. මෙම ප්‍රදේශයේ පැවති එකම පුනරුත්ථාපන ආයතනය වන බොරැල්ල දිවා නිවහන හා එය පාලනය කරන සර්වෝදය මෙන්ම එයට මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන Hope for Children ආයතනය මගින් ද තොරතුරු රැස් කළෙමි.

ඒ අනුව ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මෙන්ම සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රත්‍යයෙක අධ්‍යයනය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගතිමි. වීදි දරුවන් පිළිබඳ අධ්‍යයනයන් හි නිරත රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් දත්ත රැස් කළ අතර ග්‍රන්ථ වාර්තා,පනත්,ප්‍රඥප්ති ඇතුළු ලේඛන මගින් ද්විතීයික දත්ත රැස් කර අවශ්‍ය විෂය දැනුම ලබා ගතිමි. නිබන්ධ උපදේශක හා ආචාර්ය මණ්ඩලයෙන් ලද උපදෙස් හා දැනුම ද මෙම පර්යේෂණ නිබන්ධයට තොරතුරු රැස්කිරීමේදී මම ප්‍රයෝජනයට ගතිමි.

එසේ ලබාගත් තොරතුරුවලට අනුව පර්යේෂණ නිබන්ධයේ පළමු පරිච්ඡේදය වීදි දරුවන් පිළිබඳවත් පර්යේෂණ ක්‍රමවේදය,පර්යේෂණයේ වැදගත්කම හැඳින්වීමටත් වෙන් කළෙමි. දෙවන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ ළමා පරපුර පිළිබඳවත් තෙවන පරිච්ඡේදයෙන් වීදි දරුවන් සහ ඔවුන් පිවත්වන සමාජය පිළිබඳවත් විග්‍රහයක යෙදුනි. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ වීදි දරුවන්ගේ සමාජ,ආර්ථික හා දේශපාලන පසුබිම හතරවන පරිච්ඡේදය තුළින් ද පස්වන පරිච්ඡේදයෙන් වීදි දරුවන්ගේ පුනරුත්ථාපනය පිළිබඳවත් අවසාන පරිච්ඡේදය නිගමන, යෝජනා සඳහා යොදා ගතිමි.

ඒ අනුව රටක අනාගතය තීරණය කරනු ලබන දරුවන්ගෙන් කොටසක් වන වීදි දරුවන් පුනරුත්ථාපනය අවශ්‍යම කාරණයක් බවත් එහිදී ගැටළු මතුව තිබෙන බවත් පෙන්වා දුන්නෙමි. එම ගැටළු අවමකර ගැනීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල අවධානය යොමු කරමින් කරුණු ඉදිරිපත් කිරීමට මෙම පර්යේෂණ නිබන්ධය තුළින් උත්සහ ගත්තෙමි.



මෙහි ප්‍රධාන පද

- වීදි දරුවන්
- පුනරුත්ථාපනය
- ළමා පරපුර
- දුගීභාවය